ලක්දිව වැනසීමටත්..
ඓතිහාසික සිංහල ජාතිය විනාශ කිරීමටත්..
ලක් දෙරණෙන් නිර්මල බුදු සසුන අතුගා දැමීමටත්..
ක්‍රියාත්මක වන අදිසි බලවේගය විසින් සිදුකළ
මහා සංඝ සංහාරය

# අබිරහස් අපවත් කිරීම්


(පාලිත ටෙරාන් ජයතිලක රුසියාවේ සිට ගෙන එනු ලබන සත්‍ය වාර්තාවකි)

# එදා..

අතිපූජ්‍ය වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මහා නාහිමි
අතිපූජ්‍ය වාදීහසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි
අතිපූජ්‍ය ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි
අතිපූජ්‍ය කොටගම වාචිස්සර හිමි
අතිපූජ්‍ය ලබුදූවේ සිරිධම්ම හිමි
අතිපූජ්‍ය උණවටුණේ රතනජෝති හිමි
අතිපූජ්‍ය පානදුරේ අරියධම්ම හිමි

# මෙදා..

**අතිපූජ්‍ය ගංගොඩවිල සෝම හිමි**



# ඒ අබිරහස් ඡායාරූප පෙළ..

## අතිපූජ්‍ය ගංගොඩවිල සෝම හිමිපාණන්ගේ ඝාතනය ගැන සොයාබලමු

සෝම හිමිපාණන්ට උපාධිය ලබාදුන් බව ඇඟවීමට පරිගණක අනුසාරයෙන් කෘත්‍රිමව සකස් කරන ලද ව්‍යාජ ඡායාරූප පෙළක් මෙහිදී ඔබට දැකගත හැකිවනු ඇත. එම ඡායාරූප රුසියාවේදී සකස් කළ ඒවා වන අතර සෝම හිමිපාණන් රුසියාවේදී අපවත් වූවායින් පසුව (අපවත් කළායින් පසුව) උන්වහන්සේව විවිධ ඉරියව් වලින් තබා ඡායාරූප ගතකර ඉන් අනතුරුව එම ඡායාරූප පරිගණක අනුසාරයෙන් අදාල ස්ථානයේ පසුබිම වෙත තබා බද්ධ කර තිබේ. ඒ බව ඉතාම පැහැදිලිව ඉදිරි ඡායාරූප වලදී ඔබට දැකගත හැකිවනු ඇත.



උපාධි ප්‍රදානෝත්සවයක් වැනි, සැලකිය යුතු වැදගත් උත්සවයක් පන්ති කාමරයක් වැනි ස්ථානයක පැවැත්වීම.?
අවට බලන්න, වයිට් බෝඩ් එකක්ද ඇත. බිම අපවිත්‍ර වුණු කාපට් එකක්ද දැකගත හැකිය. පොළොවේ ඇති ටයිල් පවා වියැකීගිය බවක් දිස්වේ. මේ අනුව පෙනී යන්නේ උපාධි ප්‍රදානෝත්සවයක් තබා පාසලක සාමාන්‍ය උත්සවයක් වත් පවත්වන්නට සුදුසු අන්දමේ වටපිටාවක් හෝ උත්සවශ්‍රීයක් මෙහි නොමැති බවයි.
එසේම හොඳින් බලන්න, සෝම හිමියන්ගේ මුහුණේ දකුණුපසින් දිස්වෙන සෙවණැල්ල දිහා. එතැන සිටින අන් කිසිවකුගේ එවන් සෙවණැල්ලක් දක්නට නොමැත. එසේම එවන් සෙවණැල්ලක් ඇතිවන්නේ සෝම හිමියන් අදාල ස්ථානයේ බිත්තියට බොහෝ සමීපව සිටියා නම් පමණි. එහෙත් බිත්තිය ඇත්තේ යාර කිහිපයක් දුරිනි.



මෙහි, සෝම හිමියන්ගේ මහපට ඇඟිල්ලේ කිසියම් විකෘති පිහිටීමක් පෙන්වයි.
මහපට ඇඟිල්ල පිහිටා තිබෙන ආකාරය හොඳින් බලන්න.. එය හරියට අතින් වෙන්වී ගිය මහපට ඇඟිල්ල නැවත බද්ධ කළාක් වැනිය.
ඇත්තෙන්ම සිදුවී තිබෙන්නේද එවැන්නකි. එනම්, පරිගණක ඇසුරෙන් ඡායාරූපය බද්ධ කිරීමේදී වෙනත් තැනකින් උපුටා ගත් (කොපි) මහපට ඇඟිල්ලක් මෙතැනට ගෙන බද්ධ කිරීමයි (පේස්ට්)

**(ලබාදුන්නා යැයි කියන මෙම සහතික කිසිවක් ලංකාවට එවා නොමැත)**



මෙහිදීද ඉහත ඡායාරූපයේ මෙන් අනෙක් අතේ මහපට ඇඟිල්ලද වෙනත් තැනකින් උපුටාගෙන බද්ධ කර ඇති බව මනාව පෙනේ. ඉතා හොඳින් නිරීක්ෂණය කළහොත් මහපට ඇඟිල්ල අතට බද්ධ කර ඇති ස්ථානයේ ඇති වෙනස ඉරක් ලෙස පැහැදිලිව පෙනේ. එසේම මහපට ඇඟිල්ලේ ඇති අස්වාභාවික වක්‍රාකාර භාවයද නිරීක්ෂණය කරන්න. තවද, මහපට ඇඟිල්ල තිබෙන ස්ථානය අනුව බැලීමේදී ඝණකම් රාමුවක් සහිත එම සහතිකය ඒ ආකාරයට අල්ලාගෙන සිටීමට හැකියාවක් ඇත්දැයි ඔබට සිතෙනු ඇත.



මේ තවත් අද්භූත ඡායාරූපයකි. අපි කවුරුත් හොඳාකාරවම දන්නා පරිදි සෝම හිමියන් කළු පැහැය ප්‍රතික්ෂේප කළ හිමිනමකි. ඉතින් කළු පැහැය ප්‍රතික්ෂේප කළ උන්වහන්සේම කළු පැහැති ඇඳුම් ඇඟලාගෙන සිටීම විශ්වාස කළ නොහැක්කකි. එය එසේ වුවත් අනෙක් කරුණ නම් මෙවන් සුවිශේෂ වූ ඡායාරූපයක් වෙනුවෙන් සෝම හිමියන් කළු පැහැති ඇඳුම් පාවිච්චි කරාවිද යන්නය? අනෙක එය ශීතල දේශගුණයක් නම් මෙහි සිටින අනෙක් අය එවැනි ඇඳුම් ඇඳ නොසිටියේ ඇයි? අඩුතරමින් මෙහි සිටින කාන්තාවන් ස්ටොකින්ස් හෝ හැඳගෙන සිටින බවක් නොපෙනේ. අනෙක් අයට ශීතලක් දැනෙන සේයාවක් වත් මෙහි නොපෙනේ.



මෙම ඡායාරූපයේ තවත් අබිරහස් තැන් රාශියකි. මෙය උපාධි ප්‍රධානෝත්සවයට සහභාගිවූ සහ උපාධිලාභී අයගේ සමූහ ඡායාරූපයද වේ. එනම් එය ඉතා වැදගත් හා අභිමානවත් ඡායාරූපයකි. එවන් ඡායාරූපයක හැටි බලන්න.. පැත්තකින් මේසයක කොටසක් පෙනේ.. ඉඳගෙන සිටින අය විවිධ ඉරියව් වලින් සිටී.. ඔවුන්ගේ දෙපා අවශ්‍ය පරිදි හසුරුවාගෙන සිටී.. වම්පස නිල් පැහැති ඇඳුම හැඳ සිටින කාන්තාව ඉදිරියේ සිටින අනෙක් කාන්තාවගේ උරහිසේ අතක් රඳවාගෙන සිටී.. ඡයාරූපයේ කිසිදු සම්බර හෝ වැදගත් බවක් පෙනෙන්නට නැත. එසේම රතු පැහැති ඇඳුම ඇඳි කාන්තාව පැළඳ සිටින පාවහන් යුගලය වර්ග දෙකක හා පාට දෙකක එකක් වීමද අතිශයින් පුදුමසහගත සහ අස්වාභාවික සිදුවීමකි. මේ සියල්ලද පරිගණකය හරහා සිදුවූ අඩුපාඩුය.





මේ තවත් අබිරහස් පිහිටීමක්..
කවයෙන් දක්වා ඇති කොටස ඉතා හොඳින් නිරීක්ෂණය
කරන්න. සෝම හිමියන් දෙඅත් තබාගෙන සිටින ආකාරය
සහ දෙඅතේ ඇඟිලි වල ඇති අස්වාභාවික පෙනුම දෙස
හොඳින් බලන්න. හරියට අපවත් වූ දේහයක දෙඅත් හා
ඇඟිලි තබාගෙන සිටින ආකාරයක් ඔබට සිහිවනු ඇත..
මෙහි සෝම හිමියන්ගේ සිවුරට යටින් දණහිස
සහිත ප්‍රදේශය අතුරුදහන්ව ඇත. එය සමාන්තර රේඛාවක්
ආකාරයට පිහිටා තිබේ. එය හරියට පුටුව මත සිට බිමට
වැටෙන ආකාරයට සිවුර පමණක් දමා ගන්නා ලද
ඡායාරූපයක කොටසක් වැනිය. පුටුවේ දාරයේ දැඩිබව
සමාන්තර රේඛාවක් මෙන් පෙනෙන කොටස විය නොහැකිද?
එසේම, දණහිස සිට ඉණ දක්වා ප්‍රදේශය මෙතරම් පැතලි
සහ කෙටිටු (උසින් අඩු) බවින් යුක්ත ඇයි? එවන් වූ
අස්වාභාවික පිහිටීමක් උන්වහන්සේට තිබුණේ නැත.
සෝම හිමියන්ගේ ශරීරය දෙස නැවත හොඳින් බලන්න..
අනිත් අයත් එක්ක සසඳා බලන්න.. සෝම හිමියන්ගේ
ශරීරය පුංචි වී ඇත. (හැකිළී ගොස් ඇත)
මෙයද සෝම හිමියන් එම ස්ථානයේ වැඩසිටි බව
පෙන්වීමට පරිගණක ප්‍රයෝග ඇසුරින් ගත් උත්සාහයේ
තවත් අසාර්ථක ප්‍රතිඵලයකි.



ඡායාරූපය වම්පස කෙළවරේ සිටි රතු පැහැති ඇඳුම ඇඳගත් කාන්තාවගේ දෙපා වෙත ඔබේ අවධානය යොමු කරන්න.. ඇය පැළඳ සිටින්නේ වර්ග දෙකක සහ පාට දෙකක පාවහන් යුගලකි. මෙවන් වැදගත් ඡයාරූපයක් වෙනුවෙන් එසේ පෙනීසිටිය හැකිද? ඇය දෙපා තබාගෙන සිටින ආකාරයද විරූපීය. ඇයගේ වම් පාදයේ පිහිටීම අස්වාභාවිකය. එය ඉතා හොඳින් ඔබට පෙනෙනු ඇත. වම් පාදය හා එහි පැළඳ සිටින පාවහන් අතර වෙනසක් නොපෙනෙන තරම්ය. විලුඹක් නැත.. ඇය විලුඹ අනෙක් පාදය මත තබාගෙන සිටිනවා නම් විලුඹ සිට පාදයේ ඇඟිලි දක්වා කොටස මෙතරම් දිග වූයේ කෙසේද? මෙයද පරිගණක ප්‍රයෝගයේ අඩුපාඩුවකි.



මෙහි පොළොව දෙස බලන්න.. පොළොව අඳුරු හෝ අපවිත්‍ර වී තිබීමට ඉඩ තිබේ.. එහෙත්.. පොළොවේ වර්ණ දෙකක් මෙහිදී ඔබට දැකගත හැකිවනු ඇත.. එයද පරිගණක ප්‍රයෝගය තුළ සිදුවූ අඩුපාඩුවක් විය හැකිය..



බලන්න මෙහි පුටු තබා ඇති අන්දම.. මෙවන් වැදගත් අවස්ථාවකදී අපිළිවෙලට පුටු තබා තිබෙන්නේ ඇයි? මෙම ඡායාරූපයේද සෝම හිමිපාණන්ගේ හෙවණැල්ල ඉතාම අස්වාභාවික ආකාරයට දිස්වී තිබේ. මෙතැන වෙනත් කිසිදු අයෙකුගේ එවන් හෙවණැල්ලක් දැකගත නොහැකිය. අඩුම තරමින් බිත්තිය සමීපයේම වාඩිවී සිටින කාන්තාවගේවත් එවන් හෙවණැල්ලක් දැකගත නොහැකිය. වාඩිවී සිටින එම කාන්තාව මෙම ප්‍රදානය සිදුවන අවස්ථාවේ අත්පුඩි ගසනු හෝ එයට සැරසෙනුවත් දැකගත නොහැකිය. ඇය සිටින ඡයාරූප දෙකේම ඇය සිටින්නේ ඒ ආකාරයටය. මෙම ප්‍රදානය ලබාගන්නා තැනැත්තා වන තොප්පියක් හා කළු ලෝගුවක් හැඳ කුරුස පැළඳ සිටින්නේ දේවගැති අන්තෝනියෝ නම් අයෙකු බව හඳුනාගෙන තිබේ.



ඡායාරූපයේ දකුණුපසින් දැක්වෙන වීඩියෝ කැමරාවේ ඉහළින් සවිකර ඇති එළිය එල්ලකර ඇත්තේ දේවගැති අන්තෝනියෝ සහ ශාන්ති ජයසේකර වෙතය. එසේනම් ඒ අසල සිටින සෝම හිමිපාණන්ගේ හෙවණැල්ල ඝණකම් අයුරින් ශරීරයට දකුණුපසින් වැටී තිබෙන්නේ කෙසේද? ආලෝකය පැමිණෙන දිශාවට හෙවණැල්ල වැටිය නොහැක. හෙවණැල්ල වැටිය යුත්තේ සෝම හිමිපාණන්ට වම්පසිනි. එය ඕනෑම අයෙකුට සරළව තේරුම් ගතහැකි සිද්ධාන්තයකි. අපට පෙනෙන ඡායාරූපය ගත් කැමරාවේ එළිය නිසා එවන් හෙවණැල්ලක් ඇතිවූවා නම් එතැන සිටින අන් අයගේ එවන් හෙවණැල්ලක් නොපිහිටියේ ඇයි? මෙයද පරිගණක ප්‍රයෝගයේ දුර්වලතාවයකි.



කිසියම් ප්‍රදානයක් සිදුකරනු ලබන්නේ පිරිසක් ඉදිරියේ ගෞරවාන්විත හා ඉතා වැදගත් අයුරිනි. එහෙත් පැමිණ සිටින ප්‍රේක්ෂකයන්ට පසුපසින් සිදුකළ ප්‍රදානයක් මෙහි දැක්වේ. කාන්තාවට කිසියම් ප්‍රදානයක් සිදුකරන බව ඔවුන්ට පසුපස හරවා ඇති ප්‍රේක්ෂක අසුන්වල සිටින (ඡායාරූපයේ වම්පස) දේවගැති අන්තෝනියෝ දන්නවාදැයි සැක සහිතය. ප්‍රදානය සිදුකරන මොහොතේ ඒ වෙනුවෙන් අත්පොසන් දීමට ඔහුට අවස්ථාවක් නැත. ඔහුට ඒ සඳහා උවමනාවක්ද නැතිවාසේය. කලිනුත් සඳහන් කළ අන්දමට මෙවන් වැදගත් උත්සවයක් කිසිදු සැළසුමකින් තොරව සංවිධානය කළේ ඇයි? මෙහි දැක්වෙන පසුබිමෙහි වේදිකාවක්, නිවේදන කටයුතු සිදුකිරීමට මයික්‍රෆෝනයක් හෝ උත්සවයක් වෙනුවෙන් අවශ්‍යවන මූලික අංගෝපාංගවත් සපුරා නොමැත.



සෝම හිමියන් සිය සහතික පත්‍රය අතැතිව සිටින බව පෙන්නුම් කිරීමට උත්සාහ දරණ මෙම ඡායාරූපයේද බොහෝ සේ අඩුපාඩු, එසේත් නැත්නම් පරිගණක ප්‍රයෝගයේ දුර්වලතා දැකගත හැකිය. උන්වහන්සේට ඉතා වැදගත් වන මෙවන් ඡායාරූපයක්, ඉඳගෙන සිටින පිරිසක් හා පුටු අතර සිටගෙන අපිළිවෙල පසුබිමක සිට ගනු ලැබුවේ ඇයි? මෙම ඡායාරූපයේද සෝම හිමියන්ගේ හෙවණැල්ලේ අස්වාභාවික බව දක්නට තිබේ.



පහතින් දැක්වෙන ඡායාරූපයේ දකුණුපස ඉහළ කෙළවරේ බිත්තියේ හෝ තිර රෙද්දේ සුදු පැහැයට හුරු රවුමක් දැකගත හැකිය. මෙවන් සලකුනක් අන් ඡායාරූපවල දක්නට නැත. එනම් එය පරිගණක ප්‍රයෝගයේදී සිදුවූ අත්වැරැද්දක ප්‍රතිඵලයක් වියහැකිය.



හොඳින් බලන්න.. සෝම හිමියන් අතැතිව සිටින සහතිකය අල්ලාගෙන සිටින්නේ ඇඟිලි කීයකින්ද කියා? දකුණු අතේ ඉතා පැහැදිලිව ඇඟිලි 3ක් පෙනෙන අතර තවත් ඇඟිලි 2ක් සහතිකය යටට නැවී තිබෙන බව පෙනේ. එතනම ඇඟිලි 5 යි.. එසේනම් කෝ මහපට ඇඟිල්ල.? පේන ඇඟිලි අතර මහපට ඇඟිල්ල දක්නට නොමැත. උඩින්ම තිබෙන්නේ මහපට ඇඟිල්ල නම් එය විකෘති වී තිබෙන්නේ ඇයි? අනික මෙහි පෙනෙන ආකාරයට මහපට ඇඟිල්ලෙන්ද ඒ හැඩයට අල්ලාගත නොහැකි බව ඔබට වැටහෙනු ඇත. මහපට ඇඟිල්ල තිබිය යුත්තේ සහතිකයට පිටුපසිනි.. එනම් මෙහි ඇඟිලි 6කි.



උපාධි ප්‍රදානයක් සිදුකරන මේ මොහොතේ පසුබිමින් පුද්ගලයෙකු සිටීම අවිධිමත් අවස්ථාවකි. වැදගත් ඡායාරූපයක් ගනු ලබන්නේ වැදගත් පසුබිමකදීය. එසේම සිංහල බෞද්ධයෙකු යැයි කියාගන්නා සිසිර ජයසේකර, භික්ෂූන් වහන්සේ නමකට යමක් ප්‍රදානය කරන්නේ පුටුවක හිඳුවා කියාවත් නොදන්නේද?
කෙසේ වෙතත් කලිනුත් සඳහන් කළ පරිදි සෝම හිමියන්ගේ පමණක් දක්නට ලැබෙන අස්වාභාවික හෙවණැල්ල මෙහිදීද ඉතාම පැහැදිලිව ඔබට දැකගත හැකිවනු ඇත. කලින් ඡායාරූපයක සටහන්ව තිබුණු, අළුපැහැ පසුබිමේ දක්නට ලැබුණු සුදුපැහැ සලකුණ මෙහිදී දක්නට නොමැත..?



සෝම හිමිපාණන්ගේ වම් අත විකෘති වී තිබෙන අයුරු ඔබට ඉතා පැහැදිලිව පෙනෙනු ඇත. අල්ල පටන් ගන්නා ස්ථානයේ සිට ඇඟිලි කෙළවර දක්වා වූ කොටස අස්වාභාවික අන්දමින් දිගටි හෝ දික්වූ ස්වභාවයක් ගෙනඇත. මහපට ඇඟිල්ල පැහැදිලිව නොපෙනේ. මෙහිදීද පරිගණක ඇසුරෙන් ඡායාරූප බද්ධකර ඇති බව ඔබට සිතාගත හැකිය. එසේම එම අතට එහා පැත්තෙන් පෙනෙන සිවුරේ කොටසද අස්වාභාවික පිහිටීමක් ලෙසින් දැක්විය හැක. ඔබ තවත් හොඳින් මෙදෙස බැලුවහොත් සෝම හිමිපාණන්ගේ වම් අතේ ඇති තවත් විකෘති තාවයන් රැසක්ම දැකගත හැකිවනු ඇත. මෙයද ඔවුන් යොදන ලද පරිගණක ප්‍රයෝගයේ දුර්වලතා දැක්වෙන ඡායාරූපයකි.

# පසුවදන-1

මින් පෙර විග්‍රහ කළ ඒ අබිරහස් ඡායාරූප පෙළ ගරුතර සෝම හිමිපාණන් වහන්සේගේ අපවත් වීමත් සමගම, උන්වහන්සේට ආචාර්ය උපාධියක් දෙනබව කියූ රුසියාවේ පිහිටි එම මූලධර්මවාදී ආයතනයේ වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලද ඒවාය. එම ඡායාරූපවල තබූ අස්වාභාවික භාවය හෙළිදරව් වීම නිසාම වෙබ් අඩවියට ඇතුළත් කර දින කිහිපයකින්ම ඒවා ඉවත්කර ගැනීමට ඔවුන් ක්‍රියාකර තිබුණි.

ඔබ පරිගණකවේදියෙකු නම් එම ඡායාරූපවල අස්වාභාවික භාවය ඔබට හොඳින්ම අවබෝධ වනවාට සැකනැත. ඔබ ඡායාරූපකරණය හදාරා ඇත්නම් ඔබටද එය හොඳින් අවබෝධවනු ඇත. නොඑසේ නම්, ඔබ හොඳ නිරීක්ෂකයෙකු නම් ඔබටද පහසුවෙන්ම එම ඡායාරූපවල අස්වාභාවික භාවය තේරුම්යනු ඇත. විවිධ අවස්ථාවල ගන්නා ලද ඡායාරූප කිහිපයක් එකතු කරමින් සකස් කරන ලද යථෝක්ත ඡායාරූප පෙළ සැබැවින්ම සත්‍ය වසන් කිරීමට උපයෝගී කරගනු ලැබීය. එය ශ්‍රී ලංකාවාසී ජනතාව මුලා කිරීමට ගත් අසාර්ථක උත්සාහයක් බවද මෙහිදී කිවමනාය.

මේ අයුරින් විකෘති කළ ඡායාරූප නිර්මාණය කිරීමෙන් ඔවුන් බලාපොරොත්තු වී ඇත්තේ ගරුතර සෝම හිමියන් රුසියාවට විත් මූලධර්මවාදී සංවිධානයක් විසින් දෙනුලැබූ උපාධියක් බාරගත් බවත්, එසේ බාරගන්නා අවස්ථාවේ ඡායාරූප ගතකර ඒවා ප්‍රසිද්ධ කිරීමෙන් උන්වහන්සේගේ කීර්ති නාමයට හානි කිරීමත් අරමුණු කොටගෙනය.

# පසුවදන-2



ගරුතර සෝම හිමිපාණන් රුසියාවට වැඩමකර ටික දිනක් ගතවන විට මෙය කුමන්ත්‍රණයක් බව අවබෝධ වීමෙන් පසු මෙවන් පසුබිමක් තුළ තමන්හට ලබාදීමට කටයුතු කරන ආචාර්ය උපාධිය උන්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කළ බව අප ලද තොරතුරු වලින් සනාථ වේ. එහෙත් ඊට එරෙහි වූ ශ්‍රී ලාංකික දේවගැති ශාන්ති ජයසේකර ගරුතර සෝම හිමිපාණන්ට තර්ජනය කරමින්, විවිධ නින්දා අපහාස කරමින් හා ශාරීරිකව පීඩාවට පත් කරමින් බලපෑම් කළේ කළු ලෝගු හැඳගත්, කුරුස පැළඳි එම මූලධර්මවාදීන් සමග උපාධියට පෙනීසිටින ලෙසයි. නගරයෙන් දුර ඈත අධික සීතල සහිත ප්‍රදේශයක පිහිටි නිවසක බලෙන් රඳවා තැබූ ගරුතර සෝම හිමියන් හට දුරකතන ඇමතුමක් ගැනීමට පවා අවස්ථාවක් නොදුන්නේය. මෙම තර්ජන ගර්ජන මැද ඉතා අසරණ තත්වයෙන් සිටි ගරුතර සෝම හිමියන් නැවත රෝගාතුර විය. දියත් වූ කුමන්ත්‍රණයේ උච්චතම අවස්ථාව වූ එය ත්‍රිවිධ රත්නයේ මාහැඟි රත්නයක් වූ, දේශයේ පිනට පහලවූ අතිගරු ගංගොඩවිල සෝම හිමිපාණන් වහන්සේ සදහටම නිහඬ කිරීමට මූලධර්මවාදීන් සමත්විය. උන්වහන්සේ රෝගාතුර වූයේ ඉබේම නොව උන්වහන්සේට ලබාදුන් ආහාරපාන නිසා බවද හෙළිදරව් වී තිබේ. උන්වහන්සේ රෝගාතුර කරවීමටත් ඒ හරහා උන්වහන්සේව අපවත් කිරීමටත් දේවගැති ශාන්ති ජයසේකර ප්‍රමුඛ මූලධර්මවාදී සංවිධානය වගබලාගෙන ඇත. එවිට එය රෝගාතුර වීමෙන් සිදුවූ ස්වභාවික මරණයක් බව ඒත්තු ගැන්වීම ඔවුන්ගේ බලාපොරොත්තුව විය. එහෙත් ජනාධිපතිනියගේ නියමයෙන් මරණ පරීක්ෂණය සිදු නොකර ශ්‍රී දේහය ලංකාවට ගෙන ඒමට සිදුවීමෙන් ඔවුන්ගේ අවසන් උත්සාහය අසාර්ථක විය.

# පසුවදන-3

කෙසේ වෙතත් ගරුතර ගංගොඩවිල සෝම හිමිපාණන් වහන්සේගේ අබිරහස් අපවත් කිරීම තවදුරටත් අබිරහසක් නොවන්නට නම් එයට අදාල ප්‍රධානතම පුද්ගලයින් දෙදෙනා වන දේවගැති ශාන්ති ජයසේකර සහ සිසිර ජයසේකර ව අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කළ යුතුය. ඒ සඳහා ශ්‍රී ලාංකික ජනතාව රජයට බලකළ යුතු අතර නීතිය ක්‍රියාත්මක කරන කොණ්ද පණ ඇති නියම ශ්‍රී ලාංකිකයෙකුද සිටිය යුතුය.

මේ අපවත් කිරීම සැකෙවින් ගත්කළ ඉතාම සූක්‍ෂම අයුරින් සැළසුම් කර මූලධර්මවාදී සංවිධාන විසින් අඥාණ සිංහල පුද්ලයින් දෙදෙනෙකු වන ශාන්ති ජයසේකර හා සිසිර ජයසේකරට විවිධ වරප්‍රසාද ලබාදී දේශ ද්‍රෝහීන් බවට පත්කර ඔවුන් මාර්ගයෙන් සෝම හිමියන්ව ඝාතනය කරවන්නට යෙදුනි. ජාතියක් ජන්මයක් ගැන කිසිදු හැඟීමක් නැතිව මහ පොළොවට බරක් ලෙස තවමත් යහතින් ජීවත්වන ශාන්ති ජයසේකර හා සිසිර ජයසේකර, මෙතරම් විනාශයක් සිදුකර තිබියදීත් බුදු දහමෙන් පෝෂිත ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවගෙන් අදටත් අබමල් රේණුවකවත් කරදරයකින් තොරව ජීවත් වන්නට වාසනාව ලැබී ඇත. එහෙත් සත්‍ය හෙළිදරව් වීම වැඩි ඈතක නොවනු ඇත..



රුසියාවේ නගරබද පෙදෙසින් කි.මී. දහස් ගණනක් ඈතට වන්නට පිහිටි දැඩි ශීතල දේශගුණයක් ඇති ප්‍රදේශයේ සෝම හිමියන් කලක් රඳවා තබාගත් නිවස (හිම පතනය සිදුවී ඇති අයුරු බලන්න)



20 පිටුවේ සඳහන් නිවස ඈතට පෙනෙන අයුරු



සෝම හිමියන් ජීවත්ව සිටියදී අවසන් වරට මුහුණදුන් ඡායාරූපය මෙය වියහැකිය. මේ කොහේද.? මේ පුද්ගලයින් කවුද.? ඡායාරූපය ගත්තේ කවුද.? යන්න තවමත් නිශ්චිතව හඳුනාගෙන නැත.



සෝම හිමියන්ව රඳවා තැබුණු නිවසක්ද? කලින් නිවසමද? නැත්නම් වෙනත් ස්ථානයක්ද? යන්න පැහැදිලි නැත.



සාලය



නාන කාමරය

සෝම හිමි රඳවා තබාගත් නිවසක ඇතුළත ඡායාරූප



20 පිටුවේ සඳහන් සෝම හිමි රඳවා තබාගත් නිවස හිම පතනය සිදු නොවන කාලයකදී ලබාගත් ඡායාරූපයක්.




සෝම හිමියන්ට ප්‍රතිකාර ලබාදුන් බව කියන ස්ථානය



ව්‍යාජ උපාධි ප්‍රදානය සිදුකළ බව කියන අබිරහස් ඡායාරූපවල සටහන් ස්ථානය මෙයදැයි කියනු ලබයි.?




සෝම හිමියන් අපවත් කරවීමට කෙලින්ම සම්බන්ධ ප්‍රධාන පුද්ගලයින් දෙදෙනා
ගෙන් එක් අයෙක්. දේවගැති ශාන්ති ජයසේකර නමැත්තා මොහුයි.










දේවගැති ශාන්ති ජයසේකර ඔවුන්ගේ මූලධර්මවාදී
සංගමයේ සාමාජිකයින් සමග..
මෙම ආයතනය ලොව පිළිගත් ආයතනයක් නොව
මුදලට උපාධි ලබාදෙන පෞද්ගලික ආයතනයකි.



අවසානයේ...
මිනීමරු මූලධර්මවාදී සංවිධාන විසින් කුමන්ත්‍රණකාරී ලෙස ඉතා සූක්ෂමව
අතිගරු ගංගොඩවිල සෝම හිමිපාණන් වහන්සේව අපවත් කරන ලදී..








කිසිදු වගකිවයුත්තෙකු නොමැතිව
සෝම හිමිපාණන්ගේ ශ්‍රී දේහය
ලංකාවට වැඩමකෙරිණි.
ශ්‍රී දේහය තැන්පත් කර තිබුණේ
කළු පැහැති පෙට්ටියක
අගෞරවාන්විත වන ආකාරයටය


බෞද්ධ විරෝධී
N.G.O. මාෆියාව
වැනසීමට පෙළ ගැසෙමු



මෑත ඉතිහාසයේ වැඩිම මිනිස් හදවත් ප්‍රමාණයක් කම්පාවට පත්කළ
සිදුවීම මෙයවිය.. ජාතියට හොඳ නරක, යා යුතු මාවත ගැන හිතට දැනෙන්නට
කියාදුන් පියාණන් වහන්සේගේ හදිසි සමුගැනීම ජාතියට දරාගත නොහැකිවිය..
ගම් නියම්ගම්, නගර, ආයතන, නිවෙස් මෙන්ම ජාති, ආගම්, කුල භේදයෙන්
තොරව සැවොම එක්ව තම ශෝකය ප්‍රකාශ කළෝය..




ලක්ෂ 14ක යෝධ ජන ගඟක් ගලා ආ සෝම හිමි ආදාහන උළෙල
ලක් ඉතිහාසයේ අවමගුලක් වෙනුවෙන් හෝ වෙනත් ඕනෑම අවස්ථාවක්
වෙනුවෙන් වැඩිම ජන සහභාගිත්වයක් දැක්වූ අවස්ථාවද විය..








සෝම හිමි ආදාහන උළෙලට
දිවයිනේ සතර දික්භාගයෙන්
ගලා ආ ලක්ෂ 14කට අධික
ඉතිහාසගත
යෝධ ජන ගංගාව




යෙහෝවාගේ සාක්ෂිකරුවන් නම් මූලධර්මවාදී කණ්ඩායම ඔවුන්ට එරෙහිව යන අයගේ නම් ලැයිස්තුවක් සාදා ඔවුන් ඝාතනය කිරීමට සැළසුම් කර තිබිණ. මෙහි සෝම හිමියන්ගේ නමද ඇතුළත්ව තිබේ. මේ බව සෝම හිමියන් ජාතියට දැනුම් දුන්නද සිංහලයා නිදිවැදී සිටියා මිස ඉන් පලක් නොවීය.



මෑත ඉතිහාසයේ අසමසම බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකළ

**ගංගොඩවිල සෝම**

නම් ශ්‍රේෂ්ට මහා යතිවරයාණන් වහන්ස

ඔබ වහන්සේ නිවනට පෙර යළිත් වඩිනු මැනවි

රුසියාවේදී නිර්මාණය කරන ලද
මෙම පරිගණක වැඩසටහන සහ
රූප සටහන් පෙළ
ඔබට හැකි අයුරින් බෙදාහැරීමට සලස්වන්න
ඔබ සැමට සත්‍ය අවබෝධ වේවා..
සම්බුදු සසුනත් ලක් දෙරණත් බේරා ගැනීමට
නැණ නුවණ පහලවේවා..
තෙරුවන් සරණයි

---

පාලිත ටෙරාන් ජයතිලක වන මා රුසියාවේ පදිංචිව සිටිමි.
සෝම හිමි අපවත් කරවීම පිළිබඳව රුසියාවේදී මා සොයාගත්
සියලු කරුණු කාරණා මෙහිදී ඉදිරිපත් කරඇත.
මේ තොරතුරු සියල්ල බොහෝ විශ්වාසකටයුතු ආරංචි මාර්ගයෙන්
මා දැනගත් අතර ඒ සියල්ල සත්‍ය බව මෙහිදී ප්‍රකාශ කරමි.
තැපැල්, ඊ-මේල් හා සීඩී මගින් ලංකාවේ මාධ්‍ය ආයතන වෙත සහ තවත්
ශ්‍රී ලංකාවේ වගකිවයුතු පුද්ගලයින් කිහිප දෙනෙකු වෙත එවන ලදී.
*සකස් කළේ 2004-08-15 දින රුසියාවේදීය.*
shanlaachi@yahoo.com